**ශීර්ෂය 308-තැපැල්දෙපාර්තමේන්තුව**
**-------------------------------------------**

**1.** **මූල්‍ය ප්‍රකාශන**
------------------

**1.1** **තත්ත්වාගණනය කළ මතය**
---------------------------------

තැපැල්දෙපාර්තමේන්තුවේ2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ11(1) වගන්තිය ප්‍රකාරව තැපැල්දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව2022මැයි 26 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී.විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව තැපැල්දෙපාර්තමේන්තුවට අදාලවාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූලි07දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.
මෙම වාර්තාවේ 1.6ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021දෙසැම්බර් 31 දිනටතැපැල්දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම**
------------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේවගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරීසහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

--------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මකසාවද්‍යප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරීදැනුවත් කරන ලදී.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1** **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** **ආදායම් ලැබීම්**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| ආදායම් ප්‍රකාශයෙහි මුදලින් ආපසු ගෙවීම් රු.6,801,869ක් හා වැරදි නිවැරදි කිරීම් රු.18,493,453ක් සඳහාඅනුමැතිය ලබාදී නොමැති අතර ආපසු ගෙවීම්වලරු.1,319,023 ක් විනිමය අනුපාත වෙනස්වීම් මත ඇතිවූ අලාභ ඇතුළත්වී තිබුණි. | අනුමැතිය ලබා දී නොමැති ආපසු ගෙවීම් වෙනසට හේතු වී ඇත්තේ විදේශ විනිමය අලාභයක් සහ ඉතිරිය දිසා ගිණුම් කාර්යාල මඟින් හරස් සටහන් මඟින් කරන ලද නිවැරදි කිරීම් වේ. | ආදායමින් ආපසු ගෙවීම් සඳහා අනුමැතිය ලබාගත යුතුය. |

**(ආ)** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- | --- |
| (i) | දිසා ගිණුම් කාර්යාල 02ක කේවල ණය ශේෂ එකතුව සහ පාලන ගිණුමේ ශේෂය අතර රු.2,619,777 ක හඳුනා නොගත් අසමානතාවයන් පැවතුණි. | හඳුනා නොගත් වෙනස්කම් හඳුනා ගැනීමට හා<br>හඳුනාගත් වෙනස නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. | කේවල ණය ශේෂය සහ පාලන ගිණුමේ ශේෂය අතර වෙනස්කම් නොපැවතිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | වර්ෂ05 කට අධික කාලයක සිට පවතින නිවැරදි ණය කාණ්ඩය හඳුනා නොගත් ණය ශේෂයරු.1,515,466 ක්විය. | 2020 දෙසැම්බර් 31 දිනට වෙනත් යටතේ රු.4,579,274 ක් පැවති ණය ශේෂයෙන් රු.3,063,808 ක ණය ශේෂයක්2021 වසර තුළ හඳුනාගෙන ඇති අතර ඉතිරි ණය ශේෂය නිවැරදි කාණ්ඩය යටතේ හඳුනා ගැනීමට කටයුතු කරමින් පවතී. | අයවිය යුතු ණය ශේෂ ඛාණ්ඩය වෙන් කර හඳුනාගත යුතුය. |

**(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2021 වර්ෂය තුළ සිදු වූ ඇස්තමේන්තුගත අලාභයරු.2,078,400 ක් වූඅනතුරු 11 ක් හාවටිනාකම සඳහන් නොකළ වාහන අනතුරු 11 ක්සම්බන්ධ තොරතුරු පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි. | විගණන නිරීක්ෂණය පිළිගනිමි. එමඟින් පෙන්වා දී ඇති වාහන අනතුරු 2022 වර්ෂයේ මූල්‍ය තොරතුරු ප්‍රකාශවල ඇතුලත් කරන බව දන්වා සිටිමි. තවද සිද්ධීන් සිදු වූ වහාම හානි පාඩුලේඛණයේ ඇතුළත් කිරීමට නිලධාරීන් දැනුවත් කරමි. | මූල්‍ය වාර්තා තුළින් යාවත්කාලීනව සියළු තොරතුරු හෙළිදරව් කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 අග්‍රිම කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2009 වර්ෂයේ සිට පවතින රු.14,000 ක අතුරු අග්‍රිම ශේෂයක් සමාලෝචිත වර්ෂය තුලදී ද පියවීමට කටයුතු කර නොතිබුණි. | ජර්නල් සටහන් මඟින් පෙන්වා දීම නිවැරදිය. 2021 දෙසැම්බර් 31 දිනට 2009 වර්ෂයේ සිට පැවත එනශේෂයන් ඉදිරියේදී පියවීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | අතුරු අග්‍රිම ශේෂයන් සෑම වර්ෂයක්ම අවසන් දිනට පියවිය යුතුය. |

## 2.2 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පවතින හිඟ ආදායම් ශේෂය රු.101,393,616 ක් සමාලෝචිත වර්ෂය තුළදී ද අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | ජාත්‍යන්තර තැපැල් ආදායම සම්බන්ධයෙන් අදාළ වර්ෂයේ අනුමත වූ ගිණුම්වලින් මුදල් නොලද ගිණුම් ශේෂ පමණක් අදාළ වර්ෂයේ හිඟ ආදායමට ඇතුළත් කරනු ලැබේ. ඒ අනුව පසු වර්ෂවලදී අනුමත වූ ගිණුම්, අදාළ ගිණුම් අයත් වර්ෂයට අදාළව හිඟ ආදායම් ලෙස ඒ ඒ වර්ෂවලදී ඇතුළත් කරනු ලබයි. එය තැපැල් දෙපාර්තමේන්තු පාලනයෙන් බැහැර වන බව දැක්විය හැකිය. | හිඟ ආදායම් අයකර ගැනීමට හැකි සෑම උත්සාහයක්ම ගත යුතු වේ. |
| (ආ) | ඇස්තමේන්තු ආදායම හා තත්‍ය ආදායම අතර ආදායම් කාණ්ඩ 32 ක හිතකර විචලනය රු.105,594 සිට රු.128,064,256 ක් දක්වා පරාසයක ද ආදායම් කාණ්ඩ 13 ක අහිතකර විචලනය රු.191,430 සිට රු.66,078,495 ක් දක්වා පරාසයක ද පැවතුණි. | තැපැල් කරනු ලබන ලිපි, පාර්සල් ප්‍රමාණය කොරෝනා වසංගත තත්වයේ වුවද අපේක්ෂිත ප්‍රමාණයට වඩා වර්ධනය වී තිබීම, විදේශ විනිමය අනුපාතිකයේ වැඩිවීම, තැපැල් මුද්දර, ආදායම් මුද්දර අලෙවිය වර්ෂය අවසානයේදී අපේක්ෂිත ප්‍රමාණයට වඩා වැඩිවීම, Cash on delivery සේවාව මහජනතාව අතර සීඝ්‍රයෙන් ප්‍රචාරණය වීම, අලෙවිකරණ උපායමාර්ග හා අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් හඳුන්වාදීම ආදී හේතූන් ආදායම වැඩිවීමට බලපා ඇත.<br>කොරෝනා වසංගතය නිසා වාර්තා කල හිඟ ආදායම් අය කරමින් පවතී. ආදායම් සංකේත අංක මාරු කිරීම සහ දේශීය හා විදේශීය මෙහෙයුම් කටයුතු අවහිරවීම ඇස්තමේන්තු ආදායම අඩු වීමට හේතු වී ඇත. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව සකස් කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | විදුලි බිල්පත්, දෙපාර්තමේන්තුව හරහා ගෙවීමේදී සාමාන්‍ය සැපයුම්වලට අදාළ විදුලි බිල්පත් පමණක් භාරගත යුතු වුවද තැපැල් කාර්යාල තොග සැපයුම්වලට අදාළව රු.37,293,337 ක් වටිනා විදුලි බිල්පත් ද භාර ගැනීම හේතුවෙන් රු.745,867ක් වූ කොමිස් ආදායමක් දෙපාර්තමේන්තුවට අහිමිවී තිබුණි. | තොග සැපයුම්වලට අදාළ බිල්පත් භාර නොගන්නා ලෙස 2012/07/31 දින අංක Acct(op/epay/02a/2012 දිනැති ලිපියට පසු විටින් විට තැපැල් දෙපාර්තමේන්තු වෙබ් අඩවිය හරහා තැපැල් කාර්යාල දැනුවත් කර ඇත. එහෙත් තැපැල් කාර්යාල මඟින් තවදුරටත් එම බිල් භාර ගැනීම සිදු කරන බැවින් නැවත වරක් තැපැල් කාර්යාල දැනුවත් කිරීමට කටයුතු කරන බව දන්වමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2.3 වියදම් කළමනාකරණය

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධි ප්‍රතිපාදන ලබාගැනීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයයන් 06 ක හා ප්‍රාග්ධන වැය විෂයන් 08 ක රු.378,886,076 ක් ඉතිරි වී තිබුණු අතර එයශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 ක සිට සියයට 97 ක පරාසයකපැවතුණි. | අතිකාල,ගමන් වියදම් හාවිදේශ ගමන් වියදම් අඩුවෙන් දැරීම, කොවිඩ් තත්ත්වය මත ප්‍රසම්පාදන කටයුතු සම්පූර්ණ කරගත නොහැකිවීම, සැපයුම්කරුවන්ගේ ප්‍රමාදය, වෙළඳපළ අමතර කොටස් හිඟවීම, අමාත්‍ය මණ්ඩල පත්‍රිකා මත වියදම් අවුරා තැබීම, සේවයට කැඳවීම සීමා කිරීම, ආනයන සීමා කිරීම්, අලාභ කපාහැරීමට අනුමැතිය ලබාගැනීමට නොහැකි වීම, ඉදිකිරීම් කටයුතුවල පැවති ගැටළු හාමිල ගණන් ඉහළ යාම වැනි කටයුතු සමස්තයක් ලෙස මේ සඳහා බලපා තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදිව ඇස්තමේන්තු සකස් කළ යුතු වේ. |
| (ආ) | වැය විෂයයන් 02 කට මු.රෙ 66 යටතේ මාරුකිරීම් කරන ලද ප්‍රතිපාදනරු.19,421,929ක් ඉතිරි වී තිබුණි. | තැපැල් දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් සමුළුවකට සහභාගී වීම වෙනුවෙන් දැරීමට අපේක්ෂා කරන ලද වියදම් අඩුකිරීම, කෝවිඩ් 19 තත්ත්වය මත සැපයුම්කරුවන්ගේ ප්‍රමාදය හා භාණ්ඩ හිඟතාවය මෙම ඉතිරිවීම් සඳහා හේතු වී ඇත. | -එම- |

**2.4 බැරකම් හා බැදීම්වලට එළඹීම**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාරයට වාර්තා කරන ලද රු.876,991 ක බැරකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | අතපසුවීමකින් මූල්‍ය ප්‍රකාශන සටහන (iii)හි ඇතුලත් කිරීමට නොහැකි වී ඇති අතර ඉදිරියේදී නිවැරදිව සටහන් කිරීමටඋපදෙස් දී ඇත. | සියළු බැරකම් මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කළ යුතුවේ. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනයෙහි ඇතුළත් රු.47,753,044කබැරකම් 2022 මාර්තු 10 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. | 2021 දෙසැම්බර් 31 දිනට බැදීම් හා බැරකම් ප්‍රකාශනයේ ඇතුළත් මේ වන විට නිරවුල් කර නොතිබුණු බැදීම් හා බැරකම් වලට හේතු වනුයේ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හා බිල්පත් ඉදිරිපත් නොවීම වේ. | බැරකම් හැකි ඉක්මනින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2021 දෙසැම්බර් 31 දිනට රු.13,144,156 ක් වූ බැරකම්, බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනයට ඇතුළත් කර නොතිබුණි. | යාවත්කාලීන කිරීමට කටයුතු කරන බවකාරුණිකව දන්වා සිටිමි. | සියළු බැරකම් මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කළ යුතුවේ. |

## 2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

---------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි වල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 වගන්තිය | 16,465,002 | ණයකරුවන්ගෙන් අයකරගත නොහැකි අවස්තාවලදී ඇපකරුවන්ගෙන් අයකරගත හැකි වසර 5 කට වඩා පැරණි ණය ශේෂ පැවතුණි. | හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට හා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇත. | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | | |
| (i) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | දෙපාර්තමේන්තුවේ කිසිදු වාහනයක ඉන්ධන දහන පරීක්ෂාවන් සිදු කර නොතිබුණි. | මේ වන විට දෙපාර්තමේන්තුව සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් සිදු කරමින් පවතී. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම සඳහා වූ අකෘති පත්‍ර යොමු කර ඇති අතර එකී කටයුතු අවසන් කර වාර්තා කරන ලෙස දැනුම් දී ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.6 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | කළුතර දිසා ගිණුම් කාර්යාලයේ වසර 09 ට පෙර අනාවරණය වූ රු.1,295,400 ක වටිනා මූල්‍ය වංචාවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,145,850 ක් නිරවුල් කර නොතිබුණි. | කළුතර දිසා ගිණුම් කාර්යාලයේ මූල්‍ය වංචාවට අදාල මුදලින් රු.149,550 ක මුදලක් අයකර ඇති අතර මෙම වංචාවට අදාළ ඉතිරි මුදල් පිළිබඳවද මේ වන විට හඳුනාගැනීමේ කටයුතු සිදුවන බව දැනුම් දෙමි. | දෙපාර්තමේන්තු විමර්ෂණ නිම කිරීම සඳහා දීර්ඝ කාලයක් ගත නොකර නිම කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට රු.55,091,707 කමුළු ණය ශේෂයක් පැවති අතර එයින් වසර 05 කට අධික කාලයක සිට පවතින රු.27,304,345 ක ශේෂයක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | 2022.03.31 දින වන විට රු.481,040 ක් අය කර ගෙන ඇත. කිසිදු ක්‍රියාමාර්ගයකින් අය කර ගත නොහැකි ණය ශේෂ අත්හැරීම සඳහා කටයුතු කරමින් පවතී. | ණය ශේෂ නිරවුල් කිරීමට ගත හැකි සෑම උත්සාහයක්ම ගත යුතුය. |

**2.7 තැන්පත් ශේෂයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වර්ෂ2 කට වඩාපැරණි රු.4,001,595 ක පොදු තැන්පත් ගිණුමේ ශේෂය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වසර දෙකකට වැඩි ශේෂයන් ඉදිරියේදී රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරන බව දන්වමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ප්‍රසම්පාදනයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තැපැල් කාර්යාල වල ප්‍රයෝජනය සඳහා රු.1,689,750 ක් වටිනා ඩොට් මෙට්‍රික්ස් ප්‍රින්ටර්ස් 45 ක් මිලදී ගැනීමේදී අංක 2.11.1(ඇ), 2.12, 5.3.1(ඇ), 7.4.1 හා 8.8.1(අ) දරන 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශඋපදෙස් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | විගණන නිරීක්ෂණය පිළිගනිමි. මින් ඉදිරියට එපරිදි කටයුතු කිරීමට සැලසුම් කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | රු.1,680,400 ක් වටිනාවායු සමීකරණ යන්ත්‍ර 11 ක් වෙළඳපළ මිල සැඳහුම් ක්‍රමය යටතේමිලදී ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.7.1(ආ) හා 8.9.1(ආ) ප්‍රකාරව ප්‍රතිග්‍රහන ලිපි ලබාගෙනනොතිබූ අතර භාණ්ඩ/සේවා ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | ඉදිරියේදී ගිවිසුම් අත්සන් කිරීමටත් මෙවැනි තත්ත්වයන් වළක්වා ගැනීමටත් කටයුතු කරමි. කොවිඩ් 19 තත්ත්වයද මේ සඳහා බලපා තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී වැට් සහිත රු.47,520,000 කට තැපැල් මුද්‍රා යන්ත්‍ර 50 ක් මිලදී ගැනීමේදී මාර්ගෝපදේශ 2.14.1ට පටහැනි ලෙස මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කර තිබුණි. | නිරීක්ෂණය පිළිගනිමි. පවතින සීමිත කාල සීමාව සැලකිල්ලට ගෙන 2020.09.23 දින අංක 40 දරණ ප්‍රසම්පාදන කමිටු තීරණය මගින් වෙළඳපළ මිල සැඳහුම් ක්‍රමය මගින් මිල ගණන් කැඳවීමට අනුමැතිය ලබාගෙන ඇති බව සඳහන් කරමි. | මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ බදුල්ල දිසා ගිණුම් කාර්යාලයේ හා නියෝජ්‍ය තැපැල්පති කාර්යාලයේ රු.4,919,645 ක් වූ ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් 06 කට අදාළ සියළු කටයුතු ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සිදු කර තිබුණද දෙපාර්තමේන්තුව විසින් අදාළ කාර්යය නියමිත පරිදි ඉටු වී ඇති බව සනාථ කර ගෙන නොතිබුණි.තවද ගෙවීම්වලින් නිශ්චිත මුදලක්ද රඳවාගෙන නොතිබූ අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 (ආ) ප්‍රකාරව රු.6,919,627 ක ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් 07 සඳහා කාර්ය සාධන සුරක්ෂණ ලබා ගෙන නොතිබුණි. | දෙපාර්තමේන්තුව සතුව ප්‍රමාණවත් කාර්මික නිලධාරීන් නොමැතිවීම හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් මගින් සහය ලබාගන්නා අතර ව්‍යාපෘතිය තැපැල් ස්ථානාධිපතිගේ හා ප්‍රාදේශීය තැපැල් අධිකාරීගේ නිරීක්ෂණ යටතේ ක්‍රියාත්මක වේ. ඉදිරි ප්‍රසම්පාදන කටයුතුවලදී දෙපාර්තමේන්තු ඉංජිනේරු මහතා හා කාර්මික නිලධාරීන් සම්බන්ධිකරණය කරගනිමින් ඉටු කරන කර්මාන්ත ඔවුන් ලවා අධික්ෂණය කරවා ගැනීමට කටයුතු සකස් කරගනිමි. | දෙපාර්තමේන්තුව විසින් දරනු ලබන වියදමෙහි ඵලදායීතාවය අධීක්ෂණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | රජයේ ප්‍රසම්පාදනමාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) ප්‍රකාරව රු.500,000 ඉක්ම වූ භාණ්ඩ හෝ සේවා සැපයුම් කොන්ත්‍රාත් 6 ක් සඳහා විධිමත් ගිවිසුම්වලට එළඹ නොතිබුණි. | කර්මාන්ත ඉටු කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් සහ තෝරාගත් සමිතියේ සමිති නිලධාරීන් අතර ගිවිසුම් ගතවීම සිදු විය. එබැවින් තැපැල් දෙපාර්තමේන්තුව සහ සමිතියේ නිලධාරීන් අතර ගිවිසුමකට එළෙඹීමක් සිදු නොවීය. එක් කර්මාන්තයක් සඳහා තැපැල් දෙපාර්තමේන්තුව හා සමිති නිලධාරීන් ගිවිසුම් ගතවී ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**3.2 රජයේ නිලධාරීන්ගේ ඇප තැබීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1938 අංක 01 දරන තැපැල් කාර්යාල ඇප ආඥා පනතේ 1978 සංශෝධනයට අනුව ආඥා පනතේ 6(1) සහ (2) වගන්ති ප්‍රකාරව ඉඩ දී ඇති වියදම්වලට අමතරව අවස්ථා කිහිපයකදී රු.769,435 ක් ඇප අරමුදලින් ගෙවා තිබුණි. | ගණකාධිකාරී දීමනාව 2010 වර්ෂයේ සිට තැපැල් කාර්යාල ඇප අරමුදල මගින් පාලක මණ්ඩලයේ අනුමැතිය මත මාසික ගිණුම සකස් කිරීම, අවකරණ ගිණුම් පිළියෙල කිරීම සහ ඇප අරමුදලේ ගිණුම් කටයුතු අධීක්ෂණය කිරීම වෙනුවෙන් ගණකාධිකාරී වෙත ගෙවන ලද දීමනාව බව කාරුණිකව දන්වා සිටිමි. | ආඥා පනතේ සඳහන් පරිදි කටයුතු කළ යුතුය. |
| (ආ) | ඇප අරමුදලේ කටයුතු සඳහා ස්ථාපිත කර ඇති පරිගණක මෘදුකාංග පද්ධතිය සංවර්ධනය සඳහා ඉකුත්වර්ෂයේ රු.845,970 ක්වැයකර තිබුණද එම පද්ධතිය යාවත්කාලීන වී නොතිබුණි. | 2016.12.31 දින දක්වා දත්ත ඇතුළත් කිරිම සහ මෘදුකාංග සංවර්ධන කටයුතු හා පරීක්ෂා කිරීම් සිදු කිරීම් වෙනුවෙන් පාලක මණ්ඩලයේ අනුමැතිය අනුව අදාළ ගෙවීම් සිදු කර ඇත. කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම නිසා ඉදිරියේදී පරිගණක පද්ධතිය යාවත්කාලීන කිරිමේ කටයුතු ආරම්භ කිරීමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. | වියදම් කරන මුදලට ප්‍රතිලාභය ලබාගත යුතුය. |
| (ඇ) | දිසා ගිණුම් කාර්යාල 16 ක සේවකයින් 2,366 ක ගේ වර්ෂ 08ට වඩා පැරණි නිරවුල් නොකළ ඇප මුදල් ශේෂය රු.4,706,739 ක් විය. | තැපැල් කාර්යාල අරමුදලේ අක්‍රිය ගිණුම් ලෙස වෙන් කර පෙන්වා ඇත්තේ එම ගිණුම්වලට අදාළ පුද්ගලයන්ගේ තොරතුරු සොයා ගැනීමට නොහැකිවූ වටිනාකම් වීම හේතුවෙන් එම ගිණුම් නිරවුල් කිරීමට නොහැකිවී ඇත. | සේවකයන් සතු මුදල් ඔවුන් වෙත ගෙවා නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | වර්ෂ 07 කට වැඩි කාලයක සිටඅක්‍රිය ගිණුම් යාවත්කාලීන කර නොතිබුණු අතර නිලධාරීන් 1,828 ක ගේ පොළී රහිත රු.2,098,122කඇප මුදල් හා නිලධාරීන් 30 ක ගේ විස්තර රහිත රු.671,821 ක ඇප මුදල් ශේෂ පැවතුණි. | එම කාර්යයන් ඉටුකර ගැනීම සඳහා සුදුසු වැඩ පිළිවෙලක් යෙදීමට අවශ්‍ය කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත. | අක්‍රීය ශේෂ සම්බන්ධ තොරතුරු පැවතිය යුතු අතර ඒවා හිමිකරුවන්ට ලබාදීමට හැකි සෑම උත්සාහයක්ම ගත යුතු වේ. |

## 3.3 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආරම්භක මූලික විමර්ශන සංඛ්‍යාව 2,156 ක් වූ අතර සමාලෝචිතවර්ෂයේ විමර්ශන 407ක් ඇතුළුව මුළු විමර්ශනවලින් අවසන් හා ඉවත් කරන ලද සංඛ්‍යාව584 ක් වූයෙන් ඉතිරි විමර්ෂණ සංඛ්‍යාව 1,979ක් විය. විමර්ශන කටයුතු වල යාවත්කාලීන දත්ත වගකිව යුතු නිලධාරියෙකු භාරයේ නොතිබුණි. | මේ වන විට මූලික විමර්ශණවලට අදාල තොරතුරු රැස්කරගනිමින් විස්තරාත්මක වාර්තාවක් සකස් කරමින් පවතින අතර, ඒ අනුව ඉදිරියේ එම විස්තරාත්මක වාර්තාව කඩිනමින් විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි. | විමර්ෂණ කටයුතු ඉක්මනින් අවසන්කල යුතු අතර ඒ සම්බන්ධයෙන් විස්තර ඇතුළත් වාර්තාවක් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යා යුතු වේ. |
| (ආ) | මුදල් ඇණවුම් සැසඳුම් ප්‍රකාශය | | |
| | 2013 වර්ෂයේ සිට 2018 දක්වා මුදල් ඇණවුම් පාලක නිකුත් කිරීම්වලට වඩා රු.2,192,592,952 ක් වැඩියෙන් CIGAS වැඩසටහන මගින් ගිණුම්ගත කර තිබුණු අතර2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා මුදල් ඇණවුම් පාලක ගෙවීම්වලට වඩා රු.2,352,149,235 ක් CIGAS වැඩසටහන මගින් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරැදිකිරීම සිදුකර ඒ සම්බන්ධව විගණනයවෙත දැනුවත් කිරීමට කටයුතු කරමි. | දිගින් දිගටම පවතින මෙවැනි වෙනස්කම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුවරු.1,965,766 ක් වටිනා මුද්දර අයිතම 9 ක අතිරික්තයක්ද රු.183,350ක් වටිනා මුද්දර අයිතම 10 ක ඌනතාවයක් ද විය. එසේම නාරාහේන්පිටමුද්දර අංශයේ රු.2,184,000 ක් වටිනා මුද්දර තොගයක ඌනතාවයක් පැවතුණි. | ඌණතා අතිරික්තතා නිරවුල් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. රු.2,184,000 ක මුද්දර ඌණතා කපා හැරීමට අදාල පත්‍රිකා සකසා ඉදිරිපත් කර ඇති අතර අමාත්‍යාංශයේ අනුමැතිය ලද විගස අලාභ හානි කපා හැරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | ඌනතා හා අතිරික්තතා සම්බන්ධයෙන් නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගත යුතු වේ. |
| (ඇ) | දෙපාර්තමේන්තුව විසින් 2021 දෙසැම්බර් 31 දින වන විට විධිමත්ව පවරා ගෙන නොමැති තැපැල් කාර්යාල පිහිටි ඉඩම් 421ක් විය. | තැපැල් කාර්යාල ඉඩම් විධිමත් ලෙස පවරා ගැනීමේ කටයුතු වේගවත්ව සිදු කෙරෙමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි. | තැපැල් කාර්යාලවල අයිතිය තහවුරු කර ගත යුතු වේ. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නියෝජ්‍ය තැපැල්පති තනතුර සඳහා අනුමත කාර්යය මණ්ඩලය 09 ක් වුවද තත්‍ය කාර්යය මණ්ඩලය 11 ක් වූයෙන් අනුමත කාර්යය මණ්ඩලය ඉක්මවූ බඳවා ගැනීම් සංඛ්‍යාව 02 ක් විය. | අනුමත නියෝජ්‍ය තැපැල්පති තනතුරු සංඛ්‍යාව 13 ක් වන අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව නියෝජ්‍ය තැපැල්පති තනතුර සඳහා නිලධාරින් 02 නෙක් සුදුසුකම් ලබා තිබුණි. පුරප්පාඩු වූ තනතුරු 02 ක් සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරුවලට සුදුසුකම්ලත් නිලධාරීන් අයදුම් නොකල නිසා එම තනතුරු 02 සඳහා දෙපාර්තමේන්තුවේ සුදුසුකම්ගත් නිලධාරීන් යෙදවීමට සිදු විය. ඒ අනුව තනතුරු සංඛ්‍යාව 11 ක් වී ඇති බව පෙන්වා දෙමි. | පුරප්පාඩු පිරවීමට හෝ අනුමත කාර්යය මණ්ඩල සංශෝධනයට හෝ කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දෙපාර්තමේන්තුවේ අනෙකුත් ශ්‍රේණි හා සේවා වල 2,164 ක් පුරප්පාඩු පැවති අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 62 ක් ඊට ඇතුළත් වී තිබුණි. එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද අපොහොසත් වී තිබුණි. | තැපැල් සේවා නිලධාරී 1 ශ්‍රේණියේ අනුමත කාර්ය මණ්ඩලය 876 ක් වේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව 1 ශ්‍රේණිය සඳහා සුදුසුකම් ලබන සියළු නිලධාරීන්ට උසස්වීම් ලබා දියයුතු නිසා අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා උසස්වීම් ලබා දීමට සිදුව ඇත.<br><br>ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු සියයට 75 ක් බඳවා ගැනීමට සම්මුඛ පරීක්ෂණ පැවැත්වුවද අධිකරණ ක්‍රියාමාර්ගයක් හේතුවෙන් නතර වී ඇත. විධායක සේවා ගණය 111 ශ්‍රේණියේ තනතුරු 18 ක් සම්මුඛ පරීක්ෂණ අවසන් කර අනුමැතිය සඳහා යොමු කර ඇත.<br><br>ජ්‍යෙෂ්ඨ තැපැල් අධිකාරී තනතුරෙහි පුරප්පාඩු අවශ්‍ය සේවා කාලය සම්පූර්ණ නොවීම මත පිරවීමට නොහැකි වී ඇත. සේවා කාලය අඩු කිරීමට අනුමැතිය ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් යොමු කර ඇත. | පුරප්පාඩු පිරවීමට හෝ අනුමත කාර්යය මණ්ඩල සංශෝධනයට හෝ කටයුතු කළ යුතුය. |